1

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
# MINISTRY OF FINANCE


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: MF/NP/Gen/2020/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 23.11.2021

All Secretaries
All State Secretaries
All Director Generals in Treasury Departments

**Budget Speech 2022: Submission of Project Proposals**

Budget Speech 2022 outlines the 2022-2024 medium-term programme of poverty alleviation and economic revival as envisaged within the "Vistas of Prosperity and Splendour", the policy framework of the government. The economic recovery in the post-COVID setting has given the highest priority in sectoral public investment allocations.

The government has embarked on a development path to stimulate the economy amidst the global and local challenges that arose from the COVID-19 pandemic. For this purpose, the public investment allocation for 2022 is Rs. 930 billion. Accordingly, the implementing agencies needs to implement the budget proposals as outlined in the Budget Speech 2022.

An authorization circular will be issued on a quarterly basis for the expenditures to be incurred in fiscal year 2022. It is required to formulate project proposals and action plans including cost estimates for the budget proposals that are coming under the purview of each line Ministry. These project proposal/s and the action plan/s with cost estimates should be submitted to the Department of National Planning by **20th of December 2021** to prioritize activities for funding arrangements. For project proposals that require a considerable time period for formulation may only be submitted by 31st December 2021.

As the project implementation is expected to initiate in early January 2022, your kind cooperation and timely intervention is sought in realizing the above set targets. *The format for Action Plan is attached for your kind perusal.*

S.R. Attygalle
Secretary to the Treasury

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: MF/NP/Gen/2020/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.11.23

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම භාණ්ඩාගාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරුන්

**<u>අයවැය කථාව 2022: ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම</u>**

රජයේ ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ දැක්ම" තුළ අපේක්ෂා කරන පරිදි දිළිඳුකම පිටුදැකීමේ සහ ආර්ථික පුනර්ජීවනය පිළිබඳ 2022-2024 මධ්‍ය කාලීන වැඩසටහන අයවැය කථාව 2022 මඟින් ගෙනහැර දක්වයි. ඒ අනුව, පශ්චාත්-කොවිඩ් පසුබිම තුළ ආර්ථිකය යළි නඟාසිටුවීම සඳහා ඉහළම ප්‍රමුඛත්වය ආංශික රාජ්‍ය ආයෝජන තුළ ලබා දී ඇත.

කොවිඩ්-19 වසංගතයෙන් මතු වූ ගෝලීය සහ දේශීය අභියෝග මධ්‍යයේ ආර්ථිකය උත්තේජනය කිරීමේ සංවර්ධන මාවතකට රජය අවතීර්ණ වී ඇත. මේ සඳහා වන 2022 රාජ්‍ය ආයෝජන ප්‍රතිපාදනය රු. බිලියන 930 කි. ඒ අනුව ක්‍රියාත්මක ආයතන 2022 අයවැය කථාවේ දක්වා ඇති අයවැය යෝජනා ක්‍රියාත්මක කළ යුතුය.

2022 මූල්‍ය වර්ෂයේදී වියදම් දැරීම සඳහා වූ අධිකාරී බලය කාර්තුමය පදනමින් ලබාදීමට කටයුතු කරනු ඇත. එක් එක් රේඛීය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ එන අයවැය යෝජනා සඳහා පිරිවැය ඇස්තමේන්තු ඇතුළත් ක්‍රියාකාරී සැලසුම් සහිත ව්‍යාපෘති යෝජනා සකස් කිරීම අවශ්‍ය වේ. අරමුදල් විධිවිධාන සඳහා ප්‍රමුඛත්වය දීම සඳහා ව්‍යාපෘති යෝජනා/ව සහ පිරිවැය ඇස්තමේන්තු සහිත ක්‍රියාකාරී සැලැස්ම/සැලසුම් 2021 දෙසැම්බර් 20 දින වන විට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපෘති යෝජනා සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය වන යෝජනා පමණක් 2021 දෙසැම්බර් 31 වන දිනට ඉදිරිපත් කළ හැක.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2022 ජනවාරි මස මුලදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බැවින්, ඉහත නියම කර ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබගේ කාරුණික සහය සහ කාලෝචිත මැදිහත්වීම අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරී සැලැස්ම සඳහා වන ආකෘතිය ඔබගේ කාරුණික දැනගැනීම සඳහා අමුණා ඇත.

එස්.ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්